# දයානන්ද ගුණවර්ධනගේ ආනන්ද ජවනිකා නාට්‍යයෙහි නිරූපිත ශ්‍රී ලාංකේය අධ්‍යාපනික හා ආගමික ඉතිහාසය පිළිබඳ විග්‍රහයක්

**එච්. එම්. කුසුම් හේරත්**

Mr. Dayananda Gunawardena who has made a great contribution towards introducing important features to Sri Lankan drama came to the field of drama in 1958. He created the drama *Madura Jawanika* for the centenary celebration of Ananda College in 1986. The creation of this drama was a turning point in the history of drama in Sri Lanka and it introduced many important features. The history of Sri Lankan education and religion was a priority among these, the drama clearly describes dedicated people in our society who contributed to the wellbeing of education and religious reconciliation in the country. This drama can be accepted as a creation which reminded Sri Lankans of our valuable history.

මෙරට ජාතික, ආගමික හා ආධ්‍යාපනික වැනි ක්ෂේත්‍රයන්හි වරින් වර ඇති කෙරුණ විවිධ වෙනස්කම් ගුණවර්ධනගේ නාට්‍ය නිර්මාණ කාර්යයෙහි දී බලපා ඇත. එබඳු බලපෑමක් කෙරුණු නාට්‍යයක් ලෙස **ආනන්ද ජවනිකා** හැඳින්විය හැකි ය. එම නාට්‍යය මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි හා ආගමික ක්ෂේත්‍රයෙහි එකමුතු භාවයත්, ප්‍රගතියත්, එහි ඉතිහාසයත්, ජාතික සමගියත් නිරූපණය කෙරෙන්නක් වෙයි. එනම් ආනන්ද විද්‍යාලයට සියක් වසරක් පිරීම නමැති පරමාර්ථය පෙරදැරි කර ගෙන රචනා කොට නිෂ්පාදනය කරන ලද

---

© **එච්. එම්. කුසුම් හේරත්**

සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහලල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13,** මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

මෙම නාට්‍යයෙහි අන්තර්ගත වන්නේ මිෂනාරි අධ්‍යාපන ක්‍රමයට එරෙහි ව සිංහල හා ද්‍රවිඩ දරුවන්ට නිදහසේ අධ්‍යාපනය ලැබීමට අවකාශ සලසා දීම සඳහා බිහි වූ ආනන්ද විද්‍යාලයෙහි ඉතිහාසයත් ඒ කෙරෙහි වු ආගමික මගපෙන්වීමත් ය. එය ආරම්භ කිරීම සඳහා මහත් වැර වෑයමෙන් හා කැපවීමෙන් කටයුතු කළ ගිහි පැවිදි චරිත රැසක් ම නාට්‍යයෙහි දැකිය හැකි ය. නාට්‍යය පෙළෙහි ප්‍රස්තාවනාවේ දැක්වෙන අදහස මෙහි දී සලකා බැලීම වැදගත් ය.

> ''ආනන්දය අතීතයේ සාඩම්බර, උදාර, වීර, ස්වෛරී බුද්ධිමත් ආයතනයකි. එම පුරාවෘත්තය සෑම දරුවකු ම දැනගත යුතු ය. භුක්ති විඳිය යුතු ය. පෙළඹවිය යුතු ය. ආදර්ශයට ගත යුතු ය. ආනන්දය ව්‍යාකූල වාද විවාදයන්ගෙන් පිරි ගැටුම් සහිත සිරිලක් මවගේ වේදනාවෙන් බිහිවූවකි. එහි වර්ධනය නිවහල් ජාතියක් පිබිදීම සංකේතවත් කරයි. ආනන්දයේ සිප්සතර හැදෑරූ දරුවෝ සියලු ජාතීන් ද, සියලු ආගම් ද නියෝජනය කළ හ. ආනන්දයේ නිදහස් කාහල නාදය සියවසක් රැව්දුණි. අසමාන, සනාතන ආනන්දය කාගෙත් ආදර්ශය වේවා.''[1]

ඉහත ප්‍රකාශය මගින් ආනන්ද විද්‍යාලයෙහි ඓතිහාසික වැදගත්කමත්, වර්තමානයෙහි එය කුමන ආකාරයෙන් හඳුනාගත යුතු ද යන්නත් අනාවරණය වෙයි. ආනන්ද විද්‍යාලය එහි හඳුන්වා ඇත්තේ ජාතික ආයතනයක් වශයෙනි. ජාතික සමගිය හා සහජීවනය එහි රැඳී පවතින්නේ ය. මෙම විද්‍යාලය පිහිටුවීම සඳහා කටයුතු කිරීමේ දී ඒ සඳහා කැපවූවෝ වාද විවාද හා ගැටුම් රාශියකට මුහුණ දුන් හ. එකල මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් ඒ සඳහා කිසිදු දායකත්වයක් ලබා නොදුන් අතර එතරම් බාධක මධ්‍යයේ ආනන්දය පිහිටුවීම නිදහස් කාහල නාදයක් බඳු ය.

> ''ආනන්ද විද්‍යාලය බිහිවීමට තුඩුදුන් පසුතලයත් එම පාසල බිහිවීමට උපස්තම්භක වූ සී. ඩබ්ලිව්. ලෙඩ්බිටර්, පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් හා සෙන්පති ඕල්කට් පිළිබඳවත්, ඒ ඒ කාලවල ආනන්දය ප්‍රධාන පෙළේ පාසලක තත්ත්වයට පත්කිරීමට තම දිවිය කැප කළ විවිධ තරාතිරම්වල පුද්ගලයන් පිළිබඳවත් මෙරට ජනතාවට හඳුන්වාදීමට දයානන්ද ගුණවර්ධන ශූරීන් ආනන්ද

> **ජවනිකා** නමැති ග්‍රන්ථයෙන් දරා ඇති උත්සාහය ප්‍රශංසනීය බව එකහෙළා කිව යුතු ය.'[2]

පූර්වෝක්ත විචාර මගින් **ආනන්ද ජවනිකා** බිහිවීම කෙරෙහි පාදක වූ කරුණු අනාවරණය වෙයි. දහනවවන සියවසේ දෙවැනි භාගයේ මෙරට ඇති වූ බෞද්ධ පුනරුදයේ වැදගත් ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ පාසල් පිහිටුවීම සැලකිය හැකි ය. එම පාසල් අතරින් ක්‍රි. ව. 1886 වර්ෂයේ පිටකොටුවේ ඉංග්‍රීසි පාසලක් ලෙස ඇරඹී පසු ව 1895 අගෝස්තු මස 07 වන දින මරදානේ පිහිටවූ ආනන්ද විද්‍යාලය එලෙස බිහිවූයේ මෙරට සිංහල ගිහි පැවිදි බෞද්ධ හා හින්දු ජනයාගේ නොමඳ උත්සාහය හේතුවෙනි. එම උත්සාහය පමණක් නො ව සියම, බුරුමය වැනි රටවලින් බුදුදහම ආරක්ෂා කර ගැනීම සඳහා ලැබුණු අනුග්‍රහය ද නාට්‍යයෙහි නිරූපණය වේ.

ආනන්දය වඩා වැදගත් වූයේ සිංහල හා ද්‍රවිඩ ජාතීන්ට අයත් දරුවන්ට එයින් අධ්‍යාපනය ලැබීමට අවකාශ සැලසීම හේතුවෙනි. මේ මගින් පාසල් අධ්‍යාපනයෙහි ඉතිහාසය අනාවරණය කර ඇත.

නාට්‍යයෙහි නිරූපිත මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, දොඩන්දූවේ පියරතන හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි මෙන් ම අනගාරික ධර්මපාලතුමා වැනි ගිහි පිරිස් ද නොයෙක් බාධක මධ්‍යයේ ස්ථිර අධිෂ්ඨානයෙන් යුක්ත ව දීර්ඝ ගමනක කෙළවර ආනන්ද විද්‍යාලය බිහිකිරීම මගින් සමාජයට වැදගත් ආදර්ශයක් සපයා ඇත. එනම් උත්සාහයෙන් කටයුතු කරන්නේ නම් නිශ්චිත ව ම ජයග්‍රහණය ලද හැකි බව ඒ මගින් අනාවරණය වෙයි.

ආනන්දය ආරම්භ කෙරුණ යුගයෙහි ඉංග්‍රීසි පාලකයන්ගේ බලපෑම වරින් වර ඇති වූයේ බෞද්ධ අධ්‍යාපනය කෙරෙහි ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ක්‍රිස්තියානි ආගම මෙරට ව්‍යාප්ත කර බුදුදහම රටින් තුරන් කිරීමටත්, මිෂනාරි අධ්‍යාපනය මෙරට ව්‍යාප්ත කිරීමටත් ය. ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ භික්ෂූන් වහන්සේලා හේතුවෙන් බෞද්ධ ආගම හා අධ්‍යාපන ක්‍රමය ආරක්ෂා වූයේ ය. එහෙයින් නාට්‍යකරුවා නාට්‍යය මගින් සමාජයට ලබාදෙන පණිවිඩය වන්නේ ජාතිවාදී හා ආගම්වාදී වීම නො ව අන්‍යෝන්‍ය අවබෝධයෙන් අන්‍ය ආගම් හා

ජාතීන් ආරක්‍ෂා කරමින් රටක් වශයෙන් ජීවත්වීමේ වැදගත්කම යි. පහත සඳහන් නිදර්ශනයෙන් එය වඩාත් පැහැදිලි වේ.

පානබොක්ක : ගරු සභාවෙන් අවසරයි. බෞද්ධ පමණක් නො ව ශෛව, විෂ්ණු භක්තික අපේ දරුවන්ගේ අනාගතය පිළිබඳ ව කල්පනා කිරීම සඳහා රැස්ව සිටින මේ අවස්ථාවේ දී මම විශේෂයෙන් සඳහන් කළ යුතු වෙනවා එනම්, අපේ ඕල්කට්තුමාගේ බලවත් උපකාරයෙන් අධ්‍යාපන කටයුතු සකස් වී ගෙන යද්දී අපේ විරුද්ධවාදීන් ව සිටි එංගලන්ත සභාව පැත්තෙන් ම අපට ඊට සහාය ලැබීම ගැන...[3]

පොදුවේ සියලු දරුවන් 'අපේ දරුවන්' ලෙස නම් කිරීම මගින් ම නාට්‍යකරුවා ජාතික හා ආගමික එකමුතුභාවය සංකේතවත් කර ඇත. ඔවුහු සියලු දෙනා එදින මහත් හරසරින් සිංහල අවුරුදු උත්සවයක් පැවැත්වූ හ. ඒ මගින් අන්‍යොන්‍ය සහයෝගය පැවති ආකාරය නිරූපණය කෙරෙයි. නාට්‍යකරුවා එය මතුකර දක්වන්නේ ගිරංචියාගේ චරිතය මගිනි.

ගිරංචියා : ඔන්න ඔහොමයි අපේ සිංහල බෞද්ධ, ක්‍රිස්තියානි දෙපක්‍ෂය එදා එක්කහු වෙලා ප්‍රථම වරට 1914 අප්‍රේල් මාසෙ 13 වෙනිදා සිංහල අවුරුදු උත්සවය පැවැත්තුවෙ.[4]

ඈත අතීතයේ සිට ම ලාංකේය ජනයා ධෛර්ය සම්පන්න, ශක්තිමත් ජාතියක් වූ බවත්, එය සදාකාලික ව පවත්වාගත යුත්තක් බවත් මතුකර දක්වන නාට්‍යකරුවා ඒ සඳහා යොදාගෙන ඇත්තේ ඕල්කට්තුමාගේ චරිතය යි.

ඕල්කට්තුමා : පරම විඥානාර්ථ ධර්මය අනුව අපි ගවේෂණයක යෙදී සිටින්නේ මනුෂ්‍යයාගේ පරම ශක්තිය කුමක් ද යන්න සෙවීම පිළිබඳ ව යි. එබඳු ශක්තියක් පිළිබඳ ව, එබඳු මිනිසුන් කොටසක් ගැන අපට පළමුවෙන් ම දැනගන්නට ලැබුණේ පානදුරාවාදය පිළිබඳ ආරංචියෙන්. ඒ නිසයි අපි මේ රටට ඒ මිනිස්සු සොයාගෙන ආවේ. ඉතිං ඒ මිනිස්සු කොටස මේ රටේ තවමත් සිටිනවා නම් ඔවුන්ට ඔවුන්ගේ පරපුරෙන් පරපුරට ඒ ශක්තිය විහිදුවාලන්ට හැකි නම් ඒ විශ්ව ශක්තිය මේ රටේ ඔවුන් තුළ සදාකාලික ව ම පවතින බව අපගේ ඒකාන්ත විශ්වාසය යි.[5]

ආනන්ද විද්‍යාලය විවෘත කිරීම සඳහා ලංකාවට පැමිණි ඕල්කට්තුමාගේ චරිතය ලවා නාට්‍යකරුවා දක්වන අදහස් ලාංකේය ජන සමාජයට සර්වකාලීන වැදගත්කමකින් යුක්ත ය. මෙහි දී ලාංකේය ජනයා ආනන්දය පිහිටුවීම සඳහා කැප වූ ආකාරය අනාවරණය කිරීමෙන් එකමුතුකමේ වැදගත්කම මතුකර දක්වා ඇත. මෙම නාට්‍යයෙහි අධ්‍යාපන ඉතිහාසය මනාව නිරූපණය කෙරෙන ජවනිකා වූයේ ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව නම් තුන්වැනි අංකයත්, ආනන්ද විද්‍යාලය පිහිටුවීම නම් හයවන අංකයත් ය.

තුන්වන අංකය මගින් මතුකර දැක්වෙන්නේ මිෂනාරි අධ්‍යාපන ක්‍රමයට විරුද්ධ ව බිහි වූ ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව නමින් යුත් කාර්යාලය පිළිබඳ තොරතුරු ය. ආනන්ද විද්‍යාලය පිහිටුවීම පිළිබඳ තොරතුරු මගින් අධ්‍යාපනික ඉතිහාසයෙහි වැදගත් කරුණු රැසක් අනාවරණය වේ. සමස්තයක් වශයෙන් සලකා බලන කල්හි මෙම නාට්‍යය ලාංකේය අධ්‍යාපන ඉතිහාසය මතුකර දක්වන ඓතිහාසික ග්‍රන්ථයක් බව පැහැදිලි වේ.

ලාංකේය බෞද්ධාගමික ඉතිහාසය ඉතා ඈත අතීතයට දිවයන්නකි. ශ්‍රී ලංකාව යටත් විජිතයක් බවට පත්වීමෙන් පසු බුදුදහම කෙරෙහි විවිධ බලපෑම් එල්ල වූ අතර එය ආරක්ෂා කරගැනීම සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට සහ පාලකයන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු වූ හ. වැලිවිට සරණංකර සංඝරාජ සමය මෙහි දී නිතැතින් ම අපගේ මතකයට නැගේ. එකල බෞද්ධාගමික පුනරුදය සඳහා කැප වූ ගිහි පැවිදි දෙපිරිසේ ම ක්‍රියාදාමයන් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රගතිය උදෙසා බලපෑවේ ය. ඒ හා බැඳුණු චරිත හා අවස්ථා කිහිපයක් ගුණවර්ධනගේ **ආනන්ද ජවනිකාහි** අන්තර්ගත වෙයි. එම අවස්ථා නිර්මාණය කිරීම සඳහා ඔහු කෙරෙහි බලපා ඇත්තේ ලාංකේය බෞද්ධ ඉතිහාසය යි. නාට්‍යකරුවාගේ පහත ප්‍රකාශය විමසීමෙන් එය වඩාත් පැහැදිලි වේ.

> පොතපත පිරික්සීමට පටන්ගත් අවස්ථාවේ දී පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ **සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ** නම් ග්‍රන්ථය යළිත් කියවීමේ ආශාවක් මාතුළ උපනි. එහි එන එකල ජීවත් වූ බෞද්ධ යතිවරයන් පිළිබඳ කතා තොරතුරු අතරින් ගාල්ලේ අටපට්ටම් විහාරයේ විසූ බුලත්ගම

> ධම්මාලංකාර සිරිසුමනතිස්ස හිමියන්ගේ ජීවිත කතාව **ආනන්ද ජවනිකා** නිර්මාණය කිරීම සම්බන්ධයෙන් මා සිත තදින් බැඳගන්නට වූ අතර උන්වහන්සේ ගෙනගිය අරගලය ආනන්දයේ උපත පිළිබඳ උල්පතක් සේ මට දැනෙන්නට විය.[6]
>
> බුලත්ගම ධම්මාලංකාර හිමියන්ගේ සටනට හේතු වූ කරුණු අදටත්, ඉදිරියටත් අපට සමීප වන්නේ ය. මන්ද යත් ඉංග්‍රීසි පාලකයන්ගේ ක්‍රියා පද්ධතිය තදින් ම යෙදුණේ බෞද්ධයන්ගේ අනන්‍යතාව සම්පූර්ණයෙන් ම සිඳබිඳ දැමීම සඳහා වීම යි. එහෙත්, බෞද්ධයන්ගේ එම සාධාරණ මෙන් ම අභීත සටන අන් සැමට ආදර්ශයක් සහ ජීව වායුවක් මෙන් ද විය....[7]

ඉහත කරුණුවලින් පැහැදිලි වන්නේ **ආනන්ද ජවනිකා** නිර්මාණය කිරීමේ දී ගුණවර්ධන භාවිතයට ගෙන ඇති කෘතියෙහි ඇතුළත් බෞද්ධභික්ෂූන් වහන්සේලාගේ චරිත මෙරට ආගමික ක්ෂේත්‍රයෙහි දියුණුවට මහත් කැපවීමක් සිදු කළ බව යි. ඒ අතර ගුණවර්ධන ගාල්ලේ අටපට්ටම් විහාරයේ වැඩ වසමින් ආගමට උසස් මෙහෙයක් සිදු කළ බුලත්ගම ධම්මාලංකාර හිමියන්ගේ චරිතය ප්‍රධාන තැනට ගත් බව පැහැදිලි වේ.

වැලිවිට සරණංකර සංඝරාජ හිමියෝ බුදුදහම ආරක්ෂා කරගැනීම සඳහා මහත් කැපවීමෙන් කටයුතු කළහ. උන්වහන්සේ උඩරටින් ප්‍රගතිශීලී බෞද්ධ ව්‍යාපාරය ආරම්භ කර නොයෙක් බාධක මධ්‍යයේ ආගමත්, ආගමික අධ්‍යාපන ක්‍රමයත්, බෞද්ධ සාහිත්‍යයත් නැවත ස්ථාවර තත්ත්වයකට පත් කළ හ. පසු ව රදළ බලපෑම් හේතුවෙන් එම ව්‍යාපාරය අඩාල තත්ත්වයකට පත් වූයේ ය. එම අවස්ථාවේ බුලත්ගම ධම්මාලංකාර හිමියන් ආගම පොදුවේ ආරක්ෂා කර ගැනීමේ අභිලාෂයෙන් අර්ථවත් බෞද්ධ ව්‍යාපාරයක් ගොඩනැගීමට කටයුතු කළහ. කිසිවකු සමඟ විරුද්ධ වීම ප්‍රතික්ෂේප කළ උන්වහන්සේ විරුද්ධ සමයවාදීන් හා එක් ව මිතුරු දම් පැවැත් වූ අතර අවශ්‍ය අවස්ථාවන්හි දී වාද විවාද ඇති කරගනිමින් ආගමික මත තහවුරු කළ හ. එබඳු වැදගත් ආගමික වාදයක් ලෙස පානදුරා වාදය හැඳින්විය හැකි ය. බ්‍රිතාන්‍ය රජයේ අසාධාරණකම්වලට එරෙහි ව නැඟී සිටි මෙම හිමියන් ජාත්‍යන්තර බෞද්ධ බලවේගයක් ගොඩනැඟීමට ද කටයුතු කළ හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ බෞද්ධාගම

ආරක්ෂා කර ගැනීම සඳහා සියම් රජුගෙන් සහාය ලැබීම සිදුවිය. මෙකල බෞද්ධ බලවේගයට තදින් ම විරුද්ධ ව සිටියේ බ්‍රිතාන්‍ය රජයේ අනුග්‍රහයෙන් පවත්වාගෙන ගිය රෙපරමාදු සභාව යි. මෙම සභාව මගින් ඔවුහු ම්ලේච්ඡ පිළිම වන්දනා කරන බෞද්ධයන් හා හින්දූන් මෙන් නො ව තමන් ජාත්‍යන්තර භාෂාවක් කතාකරන වාණිජත්වයේ ඉහළ තලයක සිටින ලෝකය ම නියෝජනය කරන ජන කොටසක් බවට පෙනී සිටිය හ. එසේ බෞද්ධ ව්‍යාපාරයට එරෙහි ව ක්‍රියා කළ රෙපරමාදු සභාවෙන් ම පසු ව බෞද්ධාගමට පක්ෂ පිරිසක් බිහි වූ හ. ආනන්ද විද්‍යාලයේ ප්‍රථම විදුහල්පතිවරයා වූයේ ද එබඳු පුද්ගලයෙකි.

ආනන්දය බිහිවීම සිදුවූයේ ප්‍රගතිශීලී බෞද්ධ ව්‍යාපාරයේ කැපවීමෙනි. එහෙයින් එම පාසල බිහිවීම පිළිබඳ කරුණු අනාවරණය කිරීමේ දී ආගමික ඉතිහාසය මතුකර දැක්වීම නිරායාසයෙන් ම සිදුවේ. **ආනන්ද ජවනිකා** නාට්‍යය ආරම්භ කෙරෙන්නේ ඉංග්‍රීසි ආණ්ඩුව විසින් බුදුදහම කෙරෙහි එල්ල කර තිබූ විශාල තර්ජන හේතුවෙන් බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමියන්ට සිදු වූ අසාධාරණයක් සියම් රජුට දැන්වීම සඳහා ගිරංචියා එහි ගොස් සිටින දර්ශනයකිනි. මේ මගින් ගුණවර්ධන ලංකාවට සියමෙන් ලැබුණ රාජ්‍ය අනුග්‍රහය මතුකර දක්වන්නේ ය.

ගිරංචියා :මහා රාජෝත්මයාණන් වහන්ස ඔබවහන්සේ අපේ බුලත්ගම හිමියන්ට පිළිගන්වා එවන ලද දහම් පඬුරු නිසා ම උන්වහන්සේ පමණක් නො ව අප සිංහල දේශවාසී මුළුමහත් බෞද්ධ ජනතාවට ම අප රට පාලනය කරන්නා වූ ඉංග්‍රීසි ආණ්ඩුව විසින් බලවත් අවමානයක් සිදුකොට ඇති බව ඔබවහන්සේට සැලකර සිටීමටයි මා මෙහි පැමිණ සිටින්නේ.[8]

1960 සියම් රජය විසින් බුලත්ගම හිමියන්ට තුටුපඬුරක් වශයෙන් මුද්‍රණ යන්ත්‍රයක් පිළිගැන්වීමත්, ඒ හේතුවෙන් ලංකාවේ බෞද්ධ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඒවා ප්‍රචාරය කිරීම සඳහා ආරම්භ වූ මුල් ම පුවත්පත **ලංකාලෝකය** බිහිවීමත් ආගමික වශයෙන් සිදු වූ වැදගත් සිදුවීම් ය. මුද්‍රණ යන්ත්‍රය පිළිගැන්වීමෙන් පසු එය ගාලු තොටමුණේ සිට පෙරහැරකින් අටපට්ටම් විහාරයට රැගෙන එනු ලැබීය. ඒ අවස්ථාවේ රජයෙන් අවසර නො ගෙන එබඳු පෙරහැරක් සංවිධානය කිරීම සහ පංචතූර්ය නාද පැවැත්වීම හේතුවෙන් රජයට

විරුද්ධ වීම පිළිබඳ බුලත්ගම හිමියන්ට බ්‍රිතාන්‍ය රජය විසින් නඩු පවරන ලදි. පසු ව සියම් රජු වික්ටෝරියා මහා රැජිනට කරුණු පැහැදිලි කර ලංකාවේ බුදුදහමට පනවා තිබූ නීතිරීති ලිහිල් කළ ආකාරය මෙන් ම ඒ හා බැඳුණු කරුණු රැසක් ම නාට්‍යයෙහි අන්තර්ගත වෙයි. එහි දී නාට්‍යකරුවා සරණංකර සංඝරාජ හිමියන්ගේ කාලයේ බුදුදහම පිරිහී තිබීම හේතුවෙන් 1753 වර්ෂයේ සියමෙන් උපසම්පදා භික්ෂූන් වහන්සේලා ගෙන්වා උපසම්පදාව මෙහි ස්ථාපිත කිරීම පිළිබඳ කරුණු ද මතුකර දක්වයි.

එසේ ම දොඩංදූවේ සිරි පියරතන තිස්ස හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රථම ගිහි බෞද්ධ පාසල පිහිටුවීම ද ආගමික හා අධ්‍යාපනික වශයෙන් ඇති වූ වැදගත් සිදුවීමකි. බෞද්ධ, ක්‍රිස්තියානි වාද විවාද සිදු වූ ආකාරය නාට්‍යයෙහි නිරූපණය කෙරෙන්නේ සිව්වන අංකයෙහි ය. එහි දී නාට්‍යකරුවා බෞද්ධාගම සම්බන්ධයෙන් විවිධ පුද්ගලයන් පළ කළ වැරදි මත අධ්‍යයනය කර ඒවා නාට්‍යයෙහි සංවාද සඳහා යොදමින් ඒවායේ සාවද්‍යතාව මතුකර දක්වයි. එසේ ම බෞද්ධාගමික වශයෙන් ඉතා වැදගත් වූ පානදුරාවාදය ප්‍රමුඛ ආගමික වාද රැසක් පිළිබඳ තොරතුරු නාට්‍යයෙහි අන්තර්ගත වන්නේ ය.

මිහිරිපැන්නේ ධම්මරතන හිමියන්ගේ සව්සත්දම්වාදය පිළිබඳ තොරතුරු මෙන් ම එයින් උපුටාගත් නිර්මාණ නාට්‍යයෙහි අන්තර්ගත වෙයි. නාට්‍යකරුවා ඒවා යොදාගෙන ඇත්තේ වාද විවාද මගින් මෙරට සාහිත්‍යය, ආගම හා භාෂාව කෙරෙහි සිදු වූ බලපෑම මෙන් ම එකල පැවති ආගමික ගැටලු අනාවරණය කිරීම සඳහා ය. පහත සඳහන් ගායනයෙන් ඉදිරිපත් කෙරෙන්නේ එකල සිදු වූ වාද විවාද පිළිබඳ තොරතුරු ය.

සව්සත් දම් ඒ ලසුගුරු වාදය
මිහිරිපැන්නෙ හිමි ඇරඹූ වාදය
කුලගොත් වාදය සීමා වාදය
පාරුපනේ ඒ හැටවටු වාදය
මුවහත් කරමින් ඒ මේ හැම වාදය
දහනව වැනි සිය වස අග භාගය
හට ගත්තයි බොදු කිතු සම වාදය
ගුණානන්ද හිමි කාහල නාදය

මුලින් ද බැද්දේ ගමින් ද දෙවනුව
වරාගොඩින් විත් සිව් කෝරළයට
උදන්විටින් දක්වා අභියෝගය
ගම්පොළ නුවරින් දිනමින් උඩරට
පංචමහා වාදෙන් ජය ගන්නට
පානදුරෙන් දැන් ජය සෝෂාවට
රටක් උදම් වෙයි ලොවක් පහන් වෙයි
නුවන් යොමන්නට මේ ලක් දීපෙට[9]

එකල ආගමික වාද විවාද සිදු කෙරුණේ දෙපාර්ශවය ම කිසියම් නීතිරීති පද්ධතියකට එකඟ වීමෙනි. එම නීතිරීති හා ඒ සඳහා භික්ෂූන්වහන්සේලා තුළ පැවති කැපවීමත්, සංවිධානාත්මක බවත්, සැබෑ ආගමික සංයමයත් මෙහි ඇතුළත් තොරතුරු මගින් නිරූපණය කෙරෙන අතර පහත සඳහන් ප්‍රකාශයෙන් එය වඩාත් පැහැදිලි වේ.

බුලත්ගම හිමි : ... අපේ මේ ක්‍රිස්තියානි මිත්‍රවරුන් සමග පවත්වන වාදයක් හුදෙක් අප අතර පවත්නා වූ වැරදි හැඟීම් නැති කර සැබෑ අවබෝධයක් හා සුහද මිත්‍රත්වයක් ඇති වීමට හේතු වේවායි ප්‍රාර්ථනා කරමින් වාදය පටන් ගැනීමට නියමිත වේලාව දැන් සම්ප්‍රාප්ත බව දන්වා සිටිනවා.[10]

ඉහත ප්‍රකාශය මගින් පැහැදිලි වන්නේ නාට්‍යකරුවා නිරතුරු ව ම ජාතික හා ආගමික සමගිය අපේක්ෂා කළ බව යි.

ඕල්කට්තුමාගේ ලංකා ගමන මෙරට ආගමික වශයෙන් සිදු වූ වැදගත් ඓතිහාසික සිදුවීමකි. එතුමා ලංකාවට පැමිණ ගාල්ල වැලිවත්තේ විජයානන්ද විහාරයෙහි ඉරු දින දහම් පාසල් ව්‍යාපාරය පළමු වරට ආරම්භ කළේ ය. එතෙක් පැවති පරම විඥානාර්ථ සමාගම බෞද්ධ පරම විඥානාර්ථ සමාගම නමින් නම් කිරීම හා එකී කටයුතු පවත්වාගෙන යෑමට භික්ෂූන්වහන්සේලාට පැවරීම සිදු වූ ආකාරය ද නාට්‍යයෙහි විස්තර වෙයි. අනගාරික ධර්මපාලතුමා හා සම්බන්ධ ජවනිකාවක් ද නාට්‍යයෙහි අන්තර්ගත ය. එතුමා ද බුදුදහම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ පුද්ගලයෙක් වූයේ ය. පංචශීලය ආරක්ෂා කිරීමේ වැදගත්කම එම චරිතයෙන් අනාවරණය වෙයි. නාට්‍යකරුවා මස් මාංශ අනුභව කිරීම නාට්‍යය මගින් දැඩි සේ ප්‍රතික්ෂේප කළේ ය. පෘථිවි මණ්ඩලයේ ජාතීන් අතර සිංහල ජාතිය ලෝකයේ ම සම්භාවනාවට පාත්‍ර විය යුතු උතුම් ජාතියක්

වශයෙන් ජපානයේ හිටපු තානාපතිවරයෙකු වූ සර් චාල්ස් එලියට්තුමා විසින් ප්‍රසිද්ධ කරන ලද්දේ ලාංකේය ජනතාව බුදුදහම ඇදහීම හේතුවෙන් බව ධර්මපාලතුමා ප්‍රකාශ කරනුයේ ඒ කෙරෙහි ලෝකයෙහි වූ කැමැත්ත අනාවරණය කිරීම සඳහා ය.

මේ අනුව බලන විට **ආනන්ද ජවනිකා** නාට්‍යය නිර්මාණයේ දී ගුණවර්ධන මෙරට ආගමික ඉතිහාසය හා බැඳුණු කරුණු රැසක් ම භාවිතයට ගෙන ඇති බව පැහැදිලි වේ.

> ''බෞද්ධ පුනරුද ව්‍යාපාරය පිළිබඳ ඓතිහාසික සත්‍යය වර්තමාන සමාජයට අදාළ හා වැදගත් වන්නේ කෙබඳු අයුරකින් ද? ..මෙහි ඇත්තේ හුදු අතීත පුරාජේරුවක් පමණක් යැයි අපට හැඟෙන්නේ ආනන්දය වැනි මහා බොදු විදුහල් යැයි කියාගන්නා පාසල් තුළ තිබෙන වර්තමාන ක්‍රියා පිළිවෙත් හා මෙරට තත්කාලීන බෞද්ධාගමික ස්වරූපයන් පිළිබඳ විමර්ශනය කොට බලන විට ය. අද මේ තත්ත්වය තුළින් ප්‍රකට වන්නේ දැඩි පරිහානිගත ලක්ෂණයක් නො වේ ද? ..අද වෙසෙන නාට්‍යකරුවෙකු සිය අවධානය යොමු කළ යුත්තේ මේ විෂය ක්ෂේත්‍රයෙහි පවතින අතීතය ගැන නො ව වර්තමානය කෙරෙහි ය. එහෙත් **ආනන්ද ජවනිකා** තුළ පැහැදිලි ඒකමිතියක් පවතින බව කිව යුතු ය.''

ඉහත සඳහන් විචාරයට අනුව එම විචාරකයා නාට්‍යය මගින් නිරූපණය කෙරෙන බෞද්ධ පුනරුදය හා පාසල බිහිවීම අගය කළ ද එම පාසල්වල වර්තමාන පරිහානිය මහත් ශෝචනීය තත්ත්වයක් ලෙස දකියි. ඔහුගේ අදහස අනුව නාට්‍යකරුවකු අතින් සිදුවිය යුත්තේ වර්තමාන පරිහානිය මතුකර දැක්වීම යි. බොහෝ විට අප සමාජයෙහි අතීතයේ පැවති උසස් ගුණාංග වර්තමානය වන විට විනාශයට යමින් පවතී. අප සියලු දෙනා ම කරනුයේ අතීතය පිළිබඳ උදම් වැනීම යි. අභිමානයෙන් කතා කිරීම යි. එහෙත් වර්තමාන පරිහානිය අප නොසලකා හරින තරම් ය. එසේ හෙයින් අතීතය ආදර්ශයට ගෙන වර්තමානය සහ අනාගතය සකස්කර ගැනීමට මෙම නාට්‍යය මගින් කිසියම් පූර්වාදර්ශයක් සැපයීම උදෙසා ගුණවර්ධන ගෙන ඇති වෙහෙස අප අගය කළ යුතු ය.

> ''පසුගිය සියවස අගභාගයේ සිට මෙරට ඇති වූ බෞද්ධ පුනරුදය රංගනයෙන් කියාපෑමට දයානන්ද ගුණවර්ධන ගත් උත්සාහය ප්‍රශංසනීය යි...''[12]

ගුණවර්ධන ඓතිහාසික වැදගත්කමක් සහිත සිදුවීම් රැසක් කතාපුවත් අනුසාරයෙන් වේදිකාව මතට රැගෙන විත් සමාජයේ බොහෝදෙනාට අලුතින් යමක් සිතීමට අනුබල සපයයි. මේ අනුව බලන විට **ආනන්ද ජවනිකා** ශ්‍රී ලාංකේය අධ්‍යාපනික හා ආගමික ඉතිහාසය මතුකර දක්වන වැදගත් නිර්මාණයක් ලෙස සැලකිය හැකි ය.

ආන්තික සටහන්:

1. ගුණවර්ධන, දයානන්ද, **ආනන්ද ජවනිකා,** (1989), කර්තෘ ප්‍රකාශන, රත්මලාන, 01 පිටුව
2. **ආනන්ද ජවනිකා,** (1989), 01 පිටුව
3. **ආනන්ද ජවනිකා,** (1989), 32 පිටුව
4. **ආනන්ද ජවනිකා,** (1989), 47 පිටුව
5. **ආනන්ද ජවනිකා,** (1989), 35 පිටුව
6. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ,** (1952), 01 පිටුව
7. **ආනන්ද ජවනිකා,** (1989), 35 පිටුව
8. **ආනන්ද ජවනිකා,** (1989), 03 පිටුව
9. **ආනන්ද ජවනිකා,** (1989), 25 පිටුව
10. **ආනන්ද ජවනිකා,** (1989), 28 පිටුව
11. **වේදිකාව,** (1988), (සං.), සුනිල් මිහිඳුකුල, 10 පිටුව
12. දිවයින ඉරිදා සංග්‍රහය, (1989.08.31)

ආශ්‍රිත ග්‍රන්ථ:


1. අබේපාල රෝලන්ඩ්, **ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව**, (1987), කොළඹ
2. කරුණාරත්න ඩේවිඩ්, **අනගාරික ධර්මපාලතුමා**, (1964), කොළඹ
3. කවිරත්න ආනන්ද, (1958), **නව නාටය තාරකා,** කොළඹ
4. ගුණවර්ධන, දයානන්ද, ආනන්ද ජවනිකා, (1989), කර්තෘ ප්‍රකාශන, රත්මලාන
5. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ,** (1952)
6. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, **ථෙරවාදී බෞද්ධාචාර්යයෝ,** (1952)
7. මැන්ඩිස් ජී. සී, ශ්‍රී ලංකා **ඉතිහාසයේ බෞද්ධ යුගය**, (1960), කොළඹ
8. **වේදිකාව**, (1988), (සං.) සුනිල් මිහිඳුකුල, කොළඹ
9. දිවයින ඉරිදා සංග්‍රහය, (1989.08.31)